

## හේමන්ත දම් පොකුරු
රන්සිරිමල් ප්‍රනාන්දු

රතෙන් රත් පෑ වූ
නෙතින් නෙත නෙක දෑ ලිවූ
හේමන්ත දම් පොකුරු
හිම කතර තනි වූ
හිමෙන් හිස
මල් ඔටුණු රැඳවූ....

වසන්තය පුරාවට
අතු පතර සග'වාන
පිපුණු මල් පෙති රකින
හේමන්ත සීතලට
පත් හලන එල දරන

පත් නොමැති රිකිලි අග
රත් පොකුරු දිලෙන සඳ
උණු හිමෙන් වැසුණු බිම
සැඟව නිදි වසන්තය

මල් පිපුණි දැයි නොදැන
ඈත ගිය විහඟුනට
එන්න එන්නැයි කියා
දුරුත්තේ මොරගසන

විහඟ තුඩගක නොරැඳි
වස්සාන වැස්සට හැලෙන
රත් පෑය ඉගිළ ගොස්
නිල් කළුව මැලව යන

ඒත් හිම මල් පැළඳ
රත් වනින් සිනාසෙන
අඳුරු හේමන්තයට
හාදු දෙන රත් අදර

හේමන්ත දම් පොකුරු
හිම කතර තනි වූ
හිමෙන් හිස
මල් ඔටුණු රැඳවූ....

ජනවාරි 5, 2017

## බොරපාට සිහින
චිරංගා පෙරේරා

සිතැත මැද සිහින
හෙළමින් සුසුම් සර
හිඳියි දිරිගෙන සැඟව
කවදමුත් පිපෙනකල්
ස්නේහයේ විල

අත්හරින්නට බැරිව
ඇස්කොණෙන් අල්ලගෙන
බොහෝ දිනවල බොහෝවිට
නිතරම දැනෙණ සමහරක් දුක
රැලි නගා සැරසෙයි

නිසසලව වැළපෙන
හැම වැස්සටම තෙමෙන
එකමෙක මලක් නැති
බොරපාට වූ ස්නෙහයේ විල

## වලාකුළු
**අතුල විජේවික්‍රම**

*(ජායන්තේ විරලා ලෝකේ ජනදා*
*ඉවසජ්ජනා * සත්පුරුෂයෝ වළාකුළු*
*මෙන්ම දුර්ලභව ලොව උපදිත්)*

බලා උඩසිට මිහිමඩල
දයාබරිතව අ[illegible]හි[illegible]කම
දරාගන්නට බැරිව
හෙලු කඳුළුද වැසිදිය

පුරා මල් එලයෙන් දෙරණ
නදී වැව් ඇල දොලද පොකුණ
ගියාද දිවියම දියකර
නොපා කිසිවක් ලොවෙන් රහසෙම



## සුන්දර හිමකඳු
ශ්‍යාමා හේවාවිතාරන (හයිඩ්ල්බර්ග්

සීත සෘතුව පායා ඇත කැන්ගරු දේසේ
හිම කන්දක් පායා ඇති මවුන්ට් බුලාවේ
හිම කැටියක් අතට ගන්න පහළ උනි සිතේ
මටත් ලැබුණා එය කරන්නට එහි ගිය වේලේ

පාසැල් ගිය කාලෙ මගේ අසා තිබුණාට
හිම කඳු මත ලිස්සෘා යන්ට ලැබුණිද මාහට
අසීරු කරුණක් බව එහ වටහා ගත්තට
සිතේ කොතැන තිබුණොත් නැත එහෙම යන්නට

හිමේ යන්න ආස උනත් ඉක්මන් නැහැ ඉන්ට
පැළඳ ගත්ත ආයිත්තම් ටික පැළඳින්නට යනවිට
ඇගේ බරට වඩා බරයි අඳින ඇඳුම් ටික
දා ගන්නව බූට් දෙකක් කකුල් වැහෙන්නට

ලිස්සා ගොසින් හිම බෝට්ටු වැටෙයි එක පිට
නැගිට නැගිට ආයෙ වැටෙයි ලිස්සන හිම මත
තරහක් නැහැ හිනා යනව එහෙම උනාට
ඒක තමයි සුන්දර කම හිමේ යනකොට

දුව හින්දා ආව නිසයි දැක්කෙ හිම කැට
ඇති පදමට ලිස්සා ගියා කන්දෙ උඩ සිට
සිත අහලක තිබ්බේ නැහැ හිමේ යන්නට
කොහෙදෝ සිට ආව පිනක් පහළ උනි මට

ඔසී රටේ සුන්දර තැන් බලා ගත්තට
හීනයක්ද මේ දකින්නෙ සිතෙයි මාහට
දුවයි පුතයි උදව් දුන්න නිසා අප හට
වාසනාව ලැබුණා පියවි ඇසින් දකින්නට

## මතක අසපුව අරා
**මංගලිකා ප්‍රනාන්දු**
ලින්බෲක්

සංසාර සක්මනේ
අවසාන කඩඉමයි
අතීත ආවර්ජනා
හද දවයි වේදනා

කිරි පුසුඹ ඉව කරන්
දෙව් දුවගෙ වෙස් අරන්
මා තුරුලෙ නුඹ හිඳියි
මතක අසපුව අරා

නුඹ සිනා හඬ ඇසෙයි
මිහිරි ගී සර ලෙසින්
මිදුලෙ මල් සලිත වෙයි
නුඹ ඇවිත් දෝ සිතන්

දොර කවුළු හැර පියා
සුසුම් පා කර හරිමි
නුඹේ රුව යළි මැවී
හද සුවඳ මට දැනෙයි

ජීවිතේ අනියතයි
මග හැරුණ මුත් අපව
දුවේ හමුවෙමු දිනෙක
මට යන්න අවසරයි

## කැප්පෙටිපොළ



මුදළිඳු මොනරවිල කැප්පෙටිපොල නමට
ජනපති තුමනි ඔබ ඉටු කළ යුතුකමට
පසසමි පුන පුනා එය පවසනු කුමට
නිදහස අදය ලැබුනේ මගෙ හදවතට

පර බස රකින පර ගැති පර සිරිත ලැදී
පර පුටු දෙස් පලුන් හැට අට වසර කදී
තරගය විනා නොදුටුව පරයිනගෙ හදී
මුර බල්ලන් ව පර අණ පිළිපදින ලදී

රට තුල ගැටුම් මවමින් මතු කොට බේද
කට මැත දොඩන උන්ගෙත් කට වැහුනාද
පිට රැටියනට විය යුතුමය අවබෝද
පිටකොන්දක් තිබේ ජනපතිඳුට යෝද

කැප්පෙටිපොළ ද ඔහු සහ සිටි සෙනෙවි වරු
අප්පච්චිටත් නොපෙනුනි රජ කරන තුරු
තුප්පැහියනගෙ ජඩ නීතිය දෙපළු කෙරූ
විප්ලව වාදි ගොවි පුතෙකුට කරමි ගරු

ජාතික සටන් බිම රුපු ඔද තෙද බින්ද
නායකයින්ව ගෙල සිඳ අතපය බැන්ද
ජුතක නීති තළු මරමින් රස වින්ද
පාළකයින් මෙතෙක් සිටි ගොන් හරකුන්ද

අසිපත් පහර වරදිනු දැක හෙලන ලද
"නැවතත් කොටව" කී පා විරුවෙකුගෙ ඔද
සිපගත් ජනිත බිම ගෙල සිඳ වැටුන සඳ
ඔබටත් වඩා රණවිරුවෙකු සිටිනවද

**ආර්.ජී. ධර්මදාස**

## 2017 සිට 2020 දී......
**ගාමිණි දසනායක.**

මේ අහස සහ පොළව
අයිතිකර ගත හැකිද ?
සිහිනයක නොවෙද නුඹ
තරගයක යෙදෙන්නේ.

නොගෙන කිසිවක් මෙලොව
උපත ලද නිසා නම්
ඇයිද නිරුවත් මිනිස
තවත් දැඟලිල්ල "නුඹ"

ලබා දුන් කාලයයි
මේ අවසන් වතාවයි
මේ පුංචි මවුබිමේ
හෙට දිනේ වෙනසකට
සූදානම් ද "නුඹ" ?